සියලුම හිමිකම් ඇවිරිණි.
All Right Reserved



'බෝවිටියා මල් යාය'ඉගෙනුම් නිපුණතා සංවර්ධන වැඩසටහන - 2024

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව



5 ශ්‍රේණිය

I පත්‍රය

කාලය:- පැය එකයි.

ගුරුවරුන්ගේ භාවිතය සඳහා පමණි.
මෙහි කිසිවක් නොලියන්න.

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	

අවසාන ලකුණු

ඉලක්කමෙන්	
අකුරෙන්	

නිපුණතා සංවර්ධන පෙරහුරුවට පෙනී සිටින ඔබට උපදෙස්

ඔබේ නම මෙම කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.

නම :- .....

- මෙම පෙරහුරු පත්‍රයේ ප්‍රශ්න 40 ක් ඇත.
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- සෑම ප්‍රශ්නයකට ම පිළිතුරු තුන බැගින් දී ඇත. ඒවා අතුරෙන්, එක් එක් ප්‍රශ්නයට අදාළ නිවැරදි පිළිතුර තෝරාගෙන ඊට යටින් ඉරක් අඳින්න.

ජාතික මට්ටමේ විභාගයකට ප්‍රථම වරට පෙනී සිටින පුංචි ඔබේ නිපුණතා සංවර්ධනය සඳහා පිදෙන තිළිණයකි.

1. රූප අතුරෙන් එකක වෙනසක් ඇත. එම රූපය තෝරන්න.



(1)



(2)



(3)

2. එක ම කාණ්ඩයකට ඇතුළත් කිරීමට වඩාත් ම සුදුසු උපකරණ දෙක මොනවා ද?

A 

B 

C 

D 

E 

(1) A සහ D (2) B සහ D (3) B සහ E

3. පහත දැක්වෙන රූප ඒවා අතර ඇති වඩාත් ගැළපෙන සම්බන්ධතාවය මත කාණ්ඩ දෙකකට වෙන් කළ හැකි ආකාරය කුමක් ද?

1. 

2. 


3. 


4. 

5. 

(1) 1,4 සහ 2,3,5 (2) 1,2,3, සහ 4,5 (3) 1,3,4 සහ 2,5

4. පහත රූප දෙකකට පමණක් අදාළ වන ප්‍රකාශය කුමක් ද?









(1) ඉදුණු විට පලතුරු ලෙස ආහාරයට ගනියි.
(2) පලතුරක් මෙන් ම එළවළුවක් ලෙස ද ආහාරයට ගනියි.
(3) දඬු කැබලි මඟින් පැළ ලබාගත හැකියි.

5. කොටුව තුළ ඇති රූපය සකස් කර ගැනීම සඳහා ඒ අයුරින් ම යොදා ගත යුතු රූප දෙක මොනවා ද?



(A) (B) (C) (D)


(1) B හා D (2) A හා B (3) B හා C

6. 

ගණක රාමුවක් සහ එහි සංඛ්‍යා නිරූපණයට ගණක පහක් දී ඇත. මෙමඟින් නිරූපණය කළ හැකි ඉලක්කම් හතරේ කුඩා ම සංඛ්‍යාව නිරූපණය කළහොත් එකේ ඒවා තීරුවට වැටෙන ගණක ගණන කීය ද?

(1) 4 (2) 5 (3) 2

7. පහත දැක්වෙන්නේ චතුරස්‍ර තුනකි. මෙම චතුරස්‍ර තුන යොදාගෙන සකසා ඇති රූපය කුමක් ද?



(1) (2) (3)

8. 

සමාන බරැති අඹ ගෙඩි තුනක් සහ සමාන බරැති දොඩම් ගෙඩි දෙකක් ද තරාදි පඩි ද රූපයේ දැක්වෙන පරිදි තරාදියට දමා ඇත. මේ පිළිබඳ වැරදි ප්‍රකාශය කුමක් ද?

(1) අඹවල බරත් දොඩම්වල බරත් සමාන ය.

(2) අඹ ගෙඩියක බරට වඩා දොඩම් ගෙඩියක බර අඩු ය.

(3) දොඩම් ගෙඩියක බරට වඩා අඹ ගෙඩියක බර අඩු ය.

9.

ශිෂ්‍යයා	D	C	A	B
උස	120 cm	105 cm	90 cm	165 cm

D,C,A,B ලෙස පෙළ ගැසී සිටි සිසුන් හතර දෙනාගෙන් දෙදෙනෙකු සිටි ස්ථාන එකිනෙකා මාරු වූ විට උසෙහි පිළිවෙළට පේළිය සැකසිණි. සිටි ස්ථාන වෙනස් කළ සිසුන් දෙදෙනා වන්නේ කවුරුන් ද?

(1) D,C (2) A,C (3) A,D

10. ඇඟ වටේට තලය යවා - කර කව කව බලනවා
පුංචි බබා හැමදාමත් - මම මිට්ටෙක් කරනවා
අල්ල ගන්න බැරි තරමට - රවුම් රවුම් කපනවා
මම නැති දා පුංචි බබා - ඕන කියා හඬනවා

මෙම කවියේ අදහස වඩාත් හොඳින් ගැළපිය හැක්කේ,

(1) බෝනික්කාට (2) මල් පොකුරට (3) පැන්සලට

11. පහත දැක්වෙන ඡේදයේ හිස්තැන්වලට ගැළපෙන වචන පිළිවෙළින් ඇතුළත් පිළිතුර කුමක් ද?
අප රටට පමණක් ..... වූ සුවිශේෂ ..... යුත් ශාක වර්ග අප රටේ දක්නට ලැබේ. ..... විශේෂ අවධානයකින් යුක්තව අපේ රටේ ගස් වැල් ආරක්ෂා කරගත යුතු ව ඇත.

(1) සුවිශේෂ, ආකාරයකින්, එය (2) ආවේණික, වටිනාකමකින්, එබැවින්
(3) නිදහස්, අගයකින්, එය


12. 1 සිට 10 තෙක් සංඛ්‍යා ලියූ කාඩ්පත් 10 ක් සිසුන් 10 දෙනෙකුට ලබා දී අතේ ඇති සංඛ්‍යාවල එකතුව 11 ලැබෙන සේ දෙදෙනා බැගින් කණ්ඩායම් සැකසෙන ලෙස ගුරුතුමිය උපදෙස් දුන්නේ නම් සැකසෙන කණ්ඩායම් ගණන කීය ද?
(1) 5 යි. (2) 6 යි. (3) 7 යි.

13. "අනතුරු වළක්වාගෙන විපත්වලින් සිදුවන හානි අවම කරගනිමින් ජීවත් විය හැකි පරිසරයක් අප ගොඩනඟා ගත යුතු ය. එමෙන් ම වර්තමානයේ දී අසන්නට දකින්නට ලැබෙන අනතුරු විපත් සහ වසංගත රෝග හැකි උපරිම මට්ටමින් වළක්වාගෙන කටයුතු කිරීම ඉතා වැදගත් ය. ඒ සඳහා කුඩා කල සිට ම අප හුරු විය යුතු ය." ඉහත ප්‍රකාශයේ සමස්ත අදහස වන්නේ,

(1) විපත්වලින් හානි ගෙන දෙන බවයි.
(2) අපේ ආරක්ෂාව හා පරිස්සම පිළිබඳ අපට ලොකු වගකීමක් ඇති බවයි.
(3) බෝවන රෝගවලින් පරිස්සම් විය යුතු බවයි.

14. උතුරට මුහුණ ලා සිටි කාංචනා අඩි කිහිපයක් පසු පසට ගමන් කර සම්පූර්ණ වටයක් කැරකී නැවත අඩි කිහිපයක් ඉදිරියට ගමන් කර නතර විය. කාංචනා දැන් මුහුණ ලා සිටින දිශාව කුමක් ද?
(1) දකුණ (2) උතුර (3) නැගෙනහිර

15. රටාව අනුව ? ලකුණට ගැළපෙන සංඛ්‍යාව කීය ද?




(1) 1 (2) 2 (3) 3

16. ධනංජනා, අංජනා, සංජනා හා රංජනා යන සිව්දෙනා පේළියට සිට ගෙන සිටිති. ධනංජනාගේ දකුණු පසින් තිදෙනෙක් සිටිය ද, අංජනාගේ වම් පසින් සිටින්නේ දෙදෙනෙකු පමණි. සංජනාගේ දකුණු පසින් ද දෙදෙනෙකු සිටිති. මේ අනුව නිවැරදි ප්‍රකාශය කුමක් ද?

(1) දෙකෙළවර සිටින්නේ ධනංජනා සහ අංජනා ය.
(2) මැද සිටින්නේ සංජනා හා රංජනා ය.
(3) වම් කෙළවරේ සිට බලන විට අංජනා සිටින්නේ තුන්වෙනියාට ය.

17. ත්‍රිකෝණයක් සාදා ගත හැකි වන්නේ පහත ඒවායින් කුමන හැඩ තුන සම්බන්ධ කිරීමෙන් ද?



A B C D E F

(1) ABC (2) BDE (3) BDF

18. නිමල්ගේ නංගී කමලා ය. කමලාට සිටින්නේ එක් සහෝදරයෙක් සහ සහෝදරියක් පමණි. නිමල්ට සහෝදර සහෝදරියන් කී දෙනෙක් සිටී ද?

(1) 1 (2) 3 (3) 2

19. අපිත්, සුපිත් සහ විපිත් යන තිදෙනාගෙන් අපිත්ට වඩා අනෙක් දෙදෙනා ම ගණිතයට දක්ෂ වන අතර විපිත්ට වඩා අනෙක් දෙදෙනා ම දුර්වල ය. ඒ අනුව දක්ෂතාවය අඩු ම කෙනාගේ සිට වැඩි ම කෙනා දක්වා පෙළ ගැස් වූ විට එන නම් පිළිවෙළ වන්නේ කුමක් ද?

(1) විපිත්, සුපිත් සහ අපිත් (2) අපිත්, සුපිත් සහ විපිත්
(3) සුපිත්, අපිත් සහ විපිත්

20 පලතුරු වට්ටියක අඹ ගෙඩි ගණන මෙන් දෙගුණයක් ඇපල් තිබුණි. ඇපල් ගෙඩි ගණනේත් අඹ ගෙඩි ගණනේත් එකතුව 21 කි. වට්ටියේ තිබූ අඹ ගෙඩි ගණන කීය ද?

(1) 5 (2) 6 (3) 7

21. රටාව අනුව හිස්තැනට ගැළපෙන සංඛ්‍යාව කුමක් ද?
1, 1, 2, 6, ..., 120

(1) 10 (2) 24 (3) 8

22. නිමල්ගේ නිවසට උතුරු දෙසින් පාසල පිහිටා ඇත. නිමල් ප.ව. 2.00 ට පමණ පාසල ඇරී ගෙදර එන විට ඔහුගේ සෙවණැල්ල වැටෙන පැත්ත කුමක් ද?

(1) නිමල්ට දකුණු පැත්තෙන් (2) නිමල්ට වම් පැත්තෙන්
(3) නිමල්ට ඉදිරියෙන්

23.

A	C	B
5	6	3
2	1	4


මුල් පෙළෙහි ඇති ඉලක්කම් තුනෙන් සෑදෙන විශාල ම සංඛ්‍යාවත් දෙවන පෙළෙහි ඇති ඉලක්කම් තුනෙන් සෑදෙන කුඩා ම සංඛ්‍යාවත් සෑදීමට නම් මාරු කළ යුතු තීරු දෙක කුමක් ද?

(1) B සහ C (2) A සහ B (3) A සහ C

24. සෘජුකෝණාස්‍රාකාර කොළ 10 ක් හරි මැදින් දෙකට නමා ඇමුණුම් කටු යොදා පොතක් සාදා ඇත. පොතෙහි පිටු සියල්ල 1 සිට අංක කළ විට අවසන් පිටු දෙකට එන අංක දෙකෙහි එකතුව කීය ද?

(1) 79 (2) 39 (3) 59


25. කිසියම් සිදුවීමක අවස්ථා හතරක් පහත රූපවලින් දැක්වේ. ඒවායේ නිවැරදි අනුපිළිවෙළ විය හැක්කේ කුමක් ද?




A B C D

(1) DCAB (2) ABCD (3) DCBA

26. පහත දී ඇති රූප පේළියේ ඊළඟට යෙදිය යුතු රූපය කුමක් ද?



(1) (2) (3)

27. 

ඉලක්කම්වල හැඩයේ කිසියම් ලක්ෂණයක් මත මෙම සටහනට ඉලක්කම් යොදා ඇත. ප්‍රශ්නාර්ථ ලකුණ ඇති තැනට යෙදිය නොහැකි ඉලක්කම විය හැක්කේ කුමක් ද?

(1) 6 (2) 5 (3) 2

28. භාජනයක් තුළ වර්ණ තුනකින් බෝල ඇත.කහ පාට බෝල ගණන නිල් හා රතු බෝල ගණනේ වෙනසට සමාන ය. එමෙන්ම කහ පැහැති බෝල ගණන රතු පැහැති බෝල ගණනට වඩා වැඩි ය. භාජනයේ ඇති මුළු බෝල ගණන 10 ක් නම් භාජනයේ තිබූ නිල් පැහැති බෝල ගණන කීය ද?

(1) 5 (2) 3 (3) 2


29. A, B, C, D, E යන සිසුන් පස්දෙනෙකු ළඟ පිළිවෙළින් 10, 12, 8, 13, 7 ක් ලෙස පාට පැන්සල් තිබේ. සියලු දෙනාගේ ම ළඟ ඇති පැන්සල් ගණන සමාන වීමට නම් තවත් අයෙකුට පැන්සල් ලබා දිය යුතු අවම සිසුන් ගණන කීය ද?

(1) 1 (2) 3 (3) 2


30. පේළියක නිමල්ගේ වම් පැත්තෙන් සිටින්නේ පේළියේ මැද සිටින කෙනාගේ දෙපැත්තේ සිටින දෙදෙනාගෙන් කෙනෙකි. නිමල්ට දකුණු පැත්තෙන් සිටින්නේ 8 දෙනෙකු පමණක් නම් පේළියේ සිටින මුළු ළමයි ගණන විය හැක්කේ,

(1) 15 (2) 23 (3) 21

31. රටාව අනුව හිස්තැනට ගැළපෙන රූපය කුමක් ද?



.....



(1) (2) (3)

32. ගැහැනු ළමයින් දෙදෙනෙකු අතරට පිරිමි ළමයින් දෙදෙනෙකු වන පරිදි පන්තියක ළමයි රවුමට සිටගෙන සිටිති. පසු දින එන විට පිරිමි ළමයින් නිල් මල් දෙක ගණනේත් ගැහැනු ළමයින් කහ මල් තුන ගණනේත් රැගෙන එන ලෙස ගුරුතුමිය පැවසුවා ය. සෑම ළමයෙක් ම ගුරුතුමිය කී පරිදි මල් ගෙන එන ලදී. පිරිමි ළමයින් ගෙනා මුළු මල් ගණන 16 ක් නම් ගැහැනු ළමයින් ගෙනා මුළු මල් ගණන කීය ද?

(1) 12 (2) 16 (3) 24

33. A කණ්ඩායමට වඩා B කණ්ඩායමේ ළමයි තිදෙනෙකු සිටිය හ. කණ්ඩායම් දෙකේ ම ළමයින් එකට ගෙන ගුරුතුමිය P, Q, R ලෙස සමාන කණ්ඩායම් තුනක් සකසන ලදී. ඒ අනුව B කණ්ඩායමේ සිටිය හැකි අඩු ම ළමයින් ගණන කීය ද?

(1) 4 (2) 6 (3) 5

34. පන්තියක ළමයි 10 දෙනෙක් සිටිති. එයින් දෙදෙනෙකුගේ උපන් දින එක ම දවසේ යෙදී තිබුණි. දෙදෙනාට ම මිතුරන් හැමෝගෙන් ම සුබ පැතුම්පත් ලැබුණේ නම් පන්තියේ හුවමාරු වූ සුබ පැතුම්පත් ගණන කීය ද?

(1) 16 (2) 90 (3) 18


35. වෙළෙන්දෙක් අඹ ගෙඩි තුනක් රුපියල් 60 ගණනේ ගෙන ගෙඩි 4 ක් රුපියල් 100 ගණනේ විකුණන ලදී. ගෙඩි 20 ක් විකුණන විට වෙළෙන්දා ලබන ලාබය කීය ද?

(1) රුපියල් 80 (2) රුපියල් 100 (3) රුපියල් 50


36. වාහන නැවතුම්පලක ත්‍රීරෝද රථ, යතුරු පැදි හා මෝටර් රථ නවතා ඇත. වාහන වර්ග දෙකක් සමාන සංඛ්‍යාවන් ඇති අතර අනෙක් වාහන වර්ගය ඊට එකක් වැඩියෙන් ඇත. නවතා ඇති මුළු වාහන ගණන 10 ක් වන අතර රෝද ගණන 30 කි. මෙහි නවතා ඇති ත්‍රීරෝද රථ ගණන කීය ද?

(1) 2 (2) 3 (3) 4

37. මෙම රූපයේ ඇති චතුරස්‍ර ගණන කීය ද?



(1) 8 (2) 9 (3) 10


38. 

මෙහි ඇත්තේ ඝනක හැඩැති ලී කුට්ටිවලින් කරන ලද ඉදිකිරීමකි. මෙම කුට්ටියේ කුඩා ඝනක වෙන් කර විශාල ම ලෙස නිර්මාණය කළ හැකි ඝනක හැඩැති කුට්ටියක් නිර්මාණය කළේ ය. ඉන් පසු ඉතිරි වූ කුඩා ලී කුට්ටි ගණන විය හැක්කේ,

(1) 27 (2) 18 (3) 36

39. මනුක, විදුර තරම් බර නැති වුව ද දිලංක මෙන් දෙගුණයක් බර ය. මනුකගේ බර වෙනුරගේ බරින් හරි අඩකි. මනුකගේත් දිලංකගේත් දෙදෙනාගේ ම බර විදුරගේ බරට සමාන ය. මනුක 20 kg ක් බර නම්, සිව්දෙනාගේ ම බරෙහි එකතුව කීය ද?

(1) 70 kg (2) 100 kg (3) 80 kg

40. 

A යනු බස් නැවතුම්පළකි. B, C, D, E, F, G, H, I යනු නිමල්ගේ මිතුරන් පිරිසකගේ නිවෙස් ය. A සිට නිවෙස්වලට දුර ප්‍රමාණයන් රූපයේ දැක්වේ. නිමල් A සිට කමල්ගේ ගෙදරට ගොස් එතැන් සිට 25km ක් ගියහොත් සාගරිකාගේ නිවස හමු වේ. සාගරිකාගේ නිවස සඳහා යොදා ඇති අක්ෂරය කුමක් ද?

(1) H (2) D (3) E

සියලුම හිමිකම් ඇවිරිණි.
All Right Reserved



'බෝවිටියා මල් යාය' ඉගෙනුම් නිපුණතා සංවර්ධන වැඩසටහන - 2024

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව



5 ශ්‍රේණිය

II පත්‍රය

කාලය පැය 1 මිනිත්තු 15

ගුරුවරුන්ගේ භාවිතය සඳහා පමණි.
මෙහි කිසිවක් නොලියන්න.

පිටු අංකය	ලැබූ ලකුණු
2	
3	
4	
5	
6	
7	
8	
එකතුව	
අවසාන ලකුණු	
ඉලක්කමෙන්	
අකුරෙන්	

නිපුණතා සංවර්ධන පෙරහුරුවට පෙනී සිටින ඔබට උපදෙස් :

- ඔබේ නම මෙම කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.

නම :- .....

- මෙම පෙරහුරු පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත.
- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු මෙම පත්‍රයේ ම සපයන්න.
- පිළිතුරු ලියන ලෙස උපදෙස් දී ඇති ප්‍රශ්නවලට තිත් ඉරි මත පිළිතුරු ලියන්න.
- පිළිතුරු යටින් ඉරක් අඳින්න යැයි උපදෙස් දී ඇති ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා ගෙන ඊට යටින් ඉරක් අඳින්න.

ජාතික මට්ටමේ විභාගයකට ප්‍රථම වරට පෙනී සිටින පුංචි ඔබේ නිපුණතා සංවර්ධනය සඳහා පිදෙන තිළිණයකි.

(1) පහත දැක්වෙන ඡේදය කියවන්න.

පිළිවෙළට හා ක්‍රමවත් ව වැඩ කිරීම මගින් අපේ එදිනෙදා කාර්යයන් පහසු කර ගත හැකි ය. එමෙන් ම සාමූහික ව කටයුතු කිරීම වඩාත් ප්‍රතිඵලදායක ය. වැඩ පහසු කර ගැනීම සඳහා අතීතයේ මිනිසුන් විවිධ සරල ක්‍රම භාවිත කළ නමුදු වර්තමානයේ මිනිස්සු බොහෝ විට ඒ සඳහා නවීන ක්‍රම භාවිත කරති.

- ඡේදය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

(i) පිළිවෙළට හා ක්‍රමවත් ව වැඩ කිරීමෙන් ඇති වන වාසිය කුමක් ද?

.....

(ii) වඩාත් ප්‍රතිඵලදායක වන්නේ කුමක් ද? .....

.....

(iii) සරල ක්‍රම භාවිතයෙන් වැඩ පහසු කර ගත්තේ කවුරුන් ද?

.....

(iv) වර්තමානයේ මිනිසුන් බොහෝ විට භාවිත කරන්නේ කුමන ක්‍රම ද?

.....

(v) වර්තමානයේ සරල ක්‍රම භාවිතය සම්පූර්ණයෙන් ම ඉවත් වී ඇති බව ඡේදයේ සඳහන් වේ ද?

.....

(vi) ඡේදයෙන් කියවෙන්නේ කුමක් ගැන ද?

.....

(2) පහත දී ඇති වාක්‍යයේ ඇති වැරදි අක්ෂර වින්‍යාසය සහිත **වචන පමණක්** නිවැරදි කර ලියන්න.

ලේඛම්තුමා අද දින සබාවාරයට පැමිණි සාමාජිකයින්ට පැමිණීමේ ලේඛණයේ අත්සන් තබන ලෙස දන්වා සිටියේ ය.

.....

(3) පහත වගන්ති ලිඛිත බසට හරවා අතීත කාලයෙන් ලියන්න.

(i) අපි හොඳින් ඉගෙන ගන්නවා

.....

(ii) විදුහල්පතිතුමිය පන්තිය නිරීක්ෂණය කරනවා

.....

(4) පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වාක්‍ය බැගින් ලියන්න.

(i) පුවත්පතට / නිමල්ගේ / ගත්තේ ය / බිත්ති / චිත්‍රය / තෝරා

.....

(ii) වැනි / වී / හට / ගුරුතුමියක / මා / ඇය / හමු / නැත

.....

(5) සුදුසු විරාම ලකුණු යොදන්න.

කෝ බලන්න ඒ මොනවා ද මම චනුකිගෙන් ඇසුවෙමි

(6) පහත සඳහන් එක් එක් යෙදුම්වල අදහස ලියන්න.

(i) අකුරක් නෑර-.....

(ii) අනූනවයෙන් බේරුණා - .....

(7) සුදුසු ම යුගල පද යොදා පහත වගන්තිය සම්පූර්ණ කරන්න.

(i)..... කොපමණ තිබුණත් සිරිමල් (ii) ..... යන්නේ බස් රථයෙනි.

(වතු පිටි / ගමන් බිමන් / ගෙවල් දොරවල් / යාන වාහන)

(8) ප්‍රාණවාචී, ස්ත්‍රීලිංග, ඒකවචන නාමපදයක් තෝරා යටින් ඉරක් අඳින්න.

බල්ලා, කාන්තාවෝ , ගංගා , ගුරුවරුන් , වෛද්‍යවරිය

(9) පහත සඳහන් සිද්ධියට ගැළපෙන ප්‍රස්තාව පිරුළ දී ඇති තිත් ඉර මත ලියන්න.

'නිමල් කොතන සිටියත් අමල් ද ඒ අසල ම සිටියි.'

.....

(10) පහත සඳහන් එක් එක් වගන්තියෙහි උක්ත ආඛ්‍යාත සම්බන්ධය නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියේ ඇති කොටුව තුළ යොදන්න.

(i) ඔහු උදෑසනින් පාසලට ගියා ය. ☐

(ii) ගෙවිලියෝ කුඹුරට ඇඹුල ගෙන ගියහ. ☐

(iii) අපි ඉදුණු අඹ ගෙඩි කඩාගෙන කෑවෙමු. ☐

(11) පහත සඳහන් ඉංග්‍රීසි වචන නිවැරදි ව සම්පූර්ණ වීමට අඩු අකුර හිස් කොටුව තුළ ලියන්න.

(i)

R		V	E	R	

(ii)

S	P	A	R	R		W

(12) එක් එක් රූපයට ගැළපෙන ඉංග්‍රීසි වචනය ඉංග්‍රීසි අකුරෙන් ම තිත් ඉර මත ලියන්න.

1.



2.



(i) .....

(ii) .....

(13) පහත දී ඇති වචන නිවැරදි ව ගළපා අර්ථවත් වැකියක් බැගින් ලියන්න.

(i) four / cat / My / has / legs :-.....

(ii) am / book / reading / I / a :-.....

(14) 'තාත්තා' යන දෙමළ වචනය සඳහා යෙදෙන සිංහල වචනය ලියන්න.

.....

(15) පහත සඳහන් වාක්‍යය දෙමළෙන් කියන ආකාරය සිංහලෙන් ලියන්න.
මට ආප්ප ඕනෑ. .....

(16) නවදහස් අනූනවයට පසු සංඛ්‍යාව ඉලක්කමෙන් ලියන්න.

.....

(17) පහත සඳහන් සංඛ්‍යාවේ ඉරි ඇඳි ඉලක්කමේ ස්ථානීය අගය ලියන්න.

8$\underline{0}$56 - .....

(18) පහත සංඛ්‍යා රටාව හඳුනාගෙන හිස්තැන්වලට ගැළපෙන සංඛ්‍යා දෙක ලියන්න.

....., 5, ..., 11, 14, 17

(19)

8, 5
0, 2

මෙම ඉලක්කම් සියල්ල ම යොදා ගෙන ලිවිය හැකි කුඩා ම සංඛ්‍යාවේ සියයස්ථානයේ පිහිටි ඉලක්කම කුමක් ද?

.....

(20) මාස තුනක් තුළ දී තේ කර්මාන්ත ශාලාවක නිපද වූ තේ කොළ පැකට් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

මාසය	1 kg පැකට්	500 g පැකට්
ජනවාරි	2082	3227
පෙබරවාරි	910	1109
මාර්තු	3650	1245

(i) ජනවාරි මාසයේ නිපද වූ මුළු තේ කොළ පැකට් ගණන කීය ද? .....

(ii) ජනවාරි මාසයට වඩා පෙබරවාරි මාසයේ නිපද වූ 500g තේ කොළ පැකට් ප්‍රමාණය කොපමණ අඩු ද? .....

(21) එක් ළමයෙකුට පොත් 4 බැගින් ළමයින් 32 ට බෙදා දීමට අවශ්‍ය පොත් ගණන කීය ද?

.....

(22) කාර් රථයක පෙට්‍රල් 15*l* ක් තිබුණි. ගමනක් යාමෙන් පසු රථයේ ඉතුරු වී තිබූ පෙට්‍රල් ප්‍රමාණය 3*l* 750m*l* කි. ගමන සඳහා වැය වූ පෙට්‍රල් ප්‍රමාණය කොපමණ ද?

.....


(23) අඹ ගෙඩි 412 ක් සමාන කූඩ හතරකට දැමූ පසු කූඩ දෙකක තිබෙන අඹ ගෙඩි ප්‍රමාණය කොපමණ ද?

.....

(24) පෙරළන ලද පොතක එක ළඟ පිටු දෙකක වම් පස පිටුවේ පිටු අංකය වූයේ viii යන්නයි. ඒ අනුව දකුණු පස පිටුවේ පිටු අංකය රෝම සංඛ්‍යාවලින් ලියන්න. .....

(25) එකක්, රු. 40.00 ක් වූ දොඩම් ගෙඩි 2 ක් හා රු. 80.00 වූ කෙසෙල් ඇවරියක් මිල දී ගත් අයෙකු ගෙවිය යුතු මුළු මුදල කීය ද? රුපියල් .....

(26) 8m 45 cm දිග රබන් පටියකින් 3m 55 cm දිග කොටසක් කපා ඉවත් කරන ලදී. ඉතුරු කොටසේ දිග කොපමණ ද? .....

(27) 


මෙම ඝන වස්තුවේ ඇති ශීර්ෂ හා දාර ගණන අතර වෙනස කිය ද?

.....

(28) හාල් 50 kg දැමිය හැකි බෑගයක ඇත්තේ හාල් 20 kg 500 g කි. එම බෑගය පිරවීමට තව කොපමණ සහල් ප්‍රමාණයක් එකතු කළ යුතු ද?

..... kg .....g

(29) සතුටුපුර ප්‍රාථමික විද්‍යාලයේ 5 වන ශ්‍රේණියේ සිසුන් ඒ ඒ විෂයයන්ට කැමැති ආකාරය දැක්වෙන තොරතුරු පහත ප්‍රස්තාරයෙන් දැක්වේ.



(i) 5 වන ශ්‍රේණියේ සිටින මුළු සිසුන් ගණන 30 ක් නම් ආගමට කැමති සිසුන් ගණන ප්‍රස්තාරයේ අඳාළ තීරුවේ දක්වන්න.

(ii) ඉංග්‍රීසි විෂයයට මෙන් දෙගුණයක් කැමති වන්නේ කුමන විෂයයට ද?

.....

- **අංක 30 සිට 59 තෙක් එක් එක් ප්‍රශ්නයට සුදුසු පිළිතුර දී ඇති පිළිතුරු අතුරෙන් තෝරා යටින් ඉරක් අඳින්න.**

(30) සිත් පහන් කිරීමේ ක්‍රියාකාරකමේ පියවර ගණන,

(1) 12 කි. (2) 5 කි. (3) 13 කි.

(31) ජාතික කොඩියේ නිමාව සහ ජාතීන් අතර එකමුතු බව කියවෙන්නේ කුමන පාටින් ද?

(1) කහ පාටින් ය. (2) කොළ පාටින් ය. (3) රතු පාටින් ය.

(32) හින්දු ආගම අදහන්නන්ගේ විශේෂ පෙරහැරකි,

(1) දළදා පෙරහැර (2) දොඩම් පෙරහැර (3) වේල් පෙරහැර

(33) 'හිමාලි පාසල් එන සෑම දිනක ම ඇහැළ මල් ගෙනාවා ය.' මෙම ප්‍රකාශය අසත්‍ය වීමට හේතුව කුමක් ද?

(1) හිමාලි පාසල් යන අයෙකු නොවේ.
(2) හිමාලි ජීවත් වෙන ප්‍රදේශයේ ඇහැළ ගස් අඩුවීම.
(3) ඇහැළ මල් කාල නියමයක් සහිත ව පිපෙන මල් වර්ගයක් වීම.

(34) බීජ ව්‍යාප්තියට වඩාත් හොඳින් උදවු කරන සතෙකු වන්නේ මින් කුමන සතා ද?

(1) 

(2) 

(3) 

(35) පානයක් ලෙස සකස් කර ගත හැකි මල් වර්ග පමණක් අඩංගු පිළිතුර තෝරන්න.

(1) බෙලි මල්, රණවරා මල්, වද මල්

(2) බෙලි මල්, රත්මල්, කතුරුමුරුංගා මල්

(3) රණවරා මල්, හාතවාරිය මල්, බෙලි මල්

(36) සමනලයාගේ ජීවන චක්‍රයේ අවස්ථාවක් වන්නේ මින් කුමක් ද?

(1) ඉස් ගෙඩි අවස්ථාව (2) කීට අවස්ථාව (3) කෝෂ අවස්ථාව

(37) 


රූපයේ දැක්වෙන සතාගේ වාසස්ථානය වනුයේ,


(1) ගස් බෙනයකි.


(2) පස් බෙනයකි.

(3) කුඩුවකි.

(38) පෙදරේරු කර්මාන්තයේ දී බිත්තියක සිරස් බව මැන බලනු ලබන්නේ පහත සඳහන් කුමන උපකරණයෙන් ද?

(1) 

(2) 

(3) 

(39) වැලි යට දමා කල් තබා ගන්නා බීජ වර්ගයකි,

(1) දෙහි (2) කොස් ඇට (3) මුං ඇට


(40) ගෙදර තිබූ මුං ඇටවල කුඩා සිදුරු විද තිබෙනු දුටු අම්මා ''මුං ඇට ටිකට ..... ගහලා'' යි පැවසුවා ය. මෙලෙස මුං ඇටවලට හානි කර ඇති සතා වනුයේ,

(1) මීයා (2) කාවා (3) ගුල්ලා

(41) පාදයකට සර්පයකු දෂ්ට කිරීම නිසා සිදුවිය නොහැකි දෙයකි,

(1) අධික රුධිර වහනය (2) අධික වේදනාව (3) විෂ ශරීරගත වීම

(42) මෙම මැහුම් ක්‍රමය භාවිත කර,



(1) වාටිය මසා ගත හැකි ය.

(2) මලක නටුව මසා ගත හැකි ය.

(3) රෙදි කැබැලි දෙකක් එකට මූට්ටු කර ගත හැකි ය.

(43) සරම්ප රෝගයේ රෝග වාහකයා වනුයේ,

(1) මදුරුවෙකි. (2) අපිරිසිදු ජලයයි. (3) රෝග වාහක පුද්ගලයෙකි.

(44) චුම්බක දෙකක් එකිනෙකට ළං කළ විට විකර්ෂණය සිදුවන අවස්ථාව දැක්වෙන රූපය තෝරන්න.

(1)

N	S	S	N

(2)

S	N	S	N

(3)

N	S	N	S

(45) බස් රථයකට ගොඩවීම සහ බැස යාම නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) කැමැති දොරටුවකින් නැඟ කැමැති දොරටුවකින් බැසීම.

(2) පසුපස දොරටුවෙන් නැඟ ඉදිරිපස දොරටුවෙන් බැසීම.

(3) ඉදිරිපස දොරටුවෙන් නැඟ පිටුපස දොරටුවෙන් බැසීම.


(46) රත් වූ ජල වාෂ්ප යොදා ගෙන තම්බා ගන්නා ආහාර වර්ගයක් වනුයේ,

(1) ආප්ප (2) මඤ්ඤොක්කා (3) හැලප

(47) දෙල් ගසේ ගෙඩි හට ගන්නේ,

(1) අතු අග ය. (2) කඳේ ය. (3) අතු මැද හා කඳේ ය.

(48)



මෙම පරීක්ෂණය මගින් සිදු කරනු ලබන්නේ,

(1) පැළවලට වතුර දමන ආකාරය නිරීක්ෂණය කිරීම.

(2) වර්ෂාව පොළොවට වැටෙන විට පසෙහි සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කිරීම.

(3) මල් බාල්දියක ක්‍රියාකාරිත්වය නිරීක්ෂණය කිරීම.


(49) කපුටු කූඩුවේ බිත්තර දමන පක්ෂියා කවුද?

(1) කෙකී (2) කෙවිලිය (3) කවුඩි

(50) දිවා රාත්‍රී ඇතිවීම කෙරෙහි බලපානු ලබන්නේ,

(1) පෘථිවි පරිභ්‍රමණයයි. (2) ඉර බැසීම හා නැඟීමයි. (3) පෘථිවි භ්‍රමණයයි.

(51) මෙම සිතියමේ අඳුරු කර ඇති පළාත කුමක් ද?



(1) දකුණු පළාත

(2) බස්නාහිර පළාත

(3) උතුරු පළාත

(52) සන්නිවේදනයේ අංග තුන අඩංගු පිළිතුර තෝරන්න.

(1) යවන්නා, ලබන්නා, ලියන්නා (2) යවන්නා, මාධ්‍යය, ලබන්නා (3) මාධ්‍යය, ලියන්නා, භාෂාව

(53) 'චන්ද්‍රිකා තාක්ෂණයේ පියා' යනුවෙන් විරුදාවලිය ලැබුවේ පහත සඳහන් අය අතුරෙන් කවුරුන් ද?

(1)




(2)



(3)



(54) 

මෙම උපකරණය යොදාගෙන කරනු ලබන කාර්යයක් නොවන්නේ මින් කුමක් ද?

(1) පුවක් කැපීම
(2) ශාන්ති කර්මවල දී දෙහි කැපීම
(3) රෙදි කැපීම

(55) බීජයක් පැළවීමට අවශ්‍ය සාධක පමණක් අඩංගු පිළිතුර තෝරන්න,

(1) ජලය, වාතය, උෂ්ණත්වය
(2) ජලය, වාතය, පස
(3) උෂ්ණත්වය, වාතය, පස

(56) 'හෙපටයිටිස්' රෝගය හඳුන්වන තවත් නමක් වනුයේ,

(1) සෙංගමාලය ය. (2) කොලරාව ය. (3) මී උණ ය.

(57) 'ඒප්‍රණය' යනු,

(1) හෙදියකගේ නිල ඇඳුමේ කොටසකි.
(2) පොලිස් කාන්තාවන්ගේ ඇඳුමේ කොටසකි.
(3) ආහාර පිළියෙල කරන්නන් අඳින ඇඳුමකි.

(58) අනෙක් වැව්වලට වඩා සොරබොර වැවේ ඇති විශේෂත්වය වනුයේ,

(1) තෙත් කලාපයේ පිහිටි වැවක් වීම.
(2) ගලින් කරන ලද විශේෂිත සොරොව්වක් තිබීම.
(3) ගොවිතැන් කටයුතු සඳහා ජලය නිකුත් නොකිරීම.

(59) බීජයක් පැළවීමේ දී ප්‍රථමයෙන් ම දක්නට ලැබෙන්නේ,

(1) මුල් ඇදෙන ආකාරය
(2) පත්‍ර හට ගන්නා ආකාරය
(3) කඳ වැඩෙන ආකාරය

(60) 'ගංගාවක් කතා කරයි' යන්න මාතෘකාව කර ගනිමින් වාක්‍යය තුනක් ලියන්න. සෑම වාක්‍යයක් ම වචන 5ට අඩු නොවිය යුතු අතර උක්ත ආඛ්‍යාත පද සම්බන්ධය හා අක්ෂර වින්‍යාසය නිවැරදි විය යුතු ය.

(1) .....
.....
(2) .....
.....
(3) .....
.....